# විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව




12

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

දොස්තර මේනක ගේ පැමිනීම තාත්තා පුදුමයට පත් කළේය. එවන් අමුත්තෙක් තාත්තා බලාපොරොත්තු නොවුණ බවක් පෙනුණි. එහෙත් ඒ බව නොඅඟවා සිටින්නට ඔහු සමත් විය.

"ලොකු දුවට වැඩ කරන තැන මොකක් හරි කරදරයක් කියල මට තේරුණා මහත්තයා..." තාත්තා කීවේ මේනක සාලයේ වාඩි වූ පසුව ය ".. මං ඒත් දුවගෙන් අහන්න ගියේ නැහැ"

" මේව මේ ලොක්කන්ගෙ ලොකු කමට කරන වැඩ.... දැන් ඒ ගැන හිතන්න දෙයක් නැහැ තාත්තා.. ස්නේහට ළබන සතියෙ ඉඳන් ආයෙම වැඩ පටන් ගන්න පුලුවන්.. මං ඒක කියන්නයි ආවෙ.." මේනක කීවේ ස්නේහා පුදුමයට පත් කරමින් ය. ස්නේහා ගෙන ආ වතුර වීදුරුව එක හුස්මට බිව් ඔහු හිස් වීදුරුව ආපසු ස්නේහා අතටම දුන්නේ ය.

"ආයෙම වැඩ පටන් ගන්න... මිස්ටර් සිරිවර්ධන මට කතාකරලා කියන්නං කිව්වනෙ ආයෙ වැඩ පටන් ගන්නකොට.." ස්නේහා කීවේ පුදුමය නිසා ය.

මේනක මදක් කල්පනා කරමින් සිටියේ ය.

"මෙහෙමයි ස්නේහා.. මේක වෙනින් හොස-"පිටල් එකක්.. මට ගොඩක් කනෙක්ෂන්ස් තියෙන තැනක්.. ඇත්තටම මේක කලින් එකට වඩා හොඳ තැනක්.. එයාල කැමතියි ඔයාට රස්සාව දෙන්න" ඔහු කීවේ ය.

මේනක මේ හැටි තමා ගැන වදවෙන්නේ ඇයිදැයි ස්නේහා සිතුවා ය. එය ඇගේ සතුටට හේතු නොවී ය. අනෙක් අතින් තමා සේවය කරමින් සිටි රෝහල වෙනුවට වෙනත් රෝහලකට යන්නට ස්නේහාගේ සිතේ කැමැත්තත් නොවී ය. ඇය කල්පනා කරමින් සිටියේ එනිසා ය.

"ඇයි ස්නේහ කල්පනාවෙ?" ඔහු ඇසුවේ ය " ..මෙතන තැනත් හොඳයි.. පඩිත් වැඩියි.. මං දන්න තැනක් නිසා කරදරත් අඩුයි.."



"අනේ සර් මං ගැන මහන්සිවෙන එක ගැන කොහොම ස්තුති කරන්නද කියල මට තේරෙන්නෙ නැහැ... ඒ වුණාට සර් ඇත්තම

"ගමට වෙලා කාලෙ නාස්ති කරන එක අපර-ාදයක් නෙවෙයිද?" ඔහු ටික වේලාවකට පසු ඇසුවේ ය. ස්නේහා සිනාසුණා ය.

"අපරාදයක්මත් නෙවෙයි.. අපරාදයක් වෙන්නෙ තේරුමක් නැතිව කාලය ගෙවෙනවනම්නෙ.. මං නිකම් හිටියෙ නෑ සර්..

මේ හිටපු ඩිංගට අපි තරුණ සමිතියෙන් ගමේ වැඩ ගොඩක් කළා.. ඒ වැඩ වලින් හිතට දැනෙන්නෙ පුදුම සතුටක්"

මේනක ගේ ඇවතුම් පැවතුම් තාත්තාගේ සිත ගෙන ඇති බව ස්නේහාට පෙනෙයි. "අහංක-ාරකමක් නැති දොස්තර මහත්තයා" මේනක ගිය පසු තාත්තා නිසැකවම කියනු ඇත.

"ස්නේහා.. ටම ඔයාට කියන්න දෙයක් තියෙනවා.." මේකන කීවේ තාත්තා ඉවත්ව ගිය පසුවය ".. මගේ හිතේ ලොකු ගිල්ටියක් තියෙනවා.. මං තමයි ඉල්ලුවෙ අකලංක බලා ගන්න ඔයාව දාන්නයි කියල .. මගේ

කිව්වොත් මං කැමතියි පොඩි වෙනසකටත් එක්ක තව ටික දවසක් ගමේ ඉන්න.." ස්නේහා කීවේ බොරුවක්ම නොවේ. ඉසුරගේ කන්ඩායම ... කරගෙන යමින් තිබෙන වැඩ ... සහයෝගයක්දීමේ දැඩි අවශ්‍යතාවක් ඇගේ සිතේ විය.

මේනක ගේ මුහුණ අඳුරු වී යනු ස්නේහා දුටුවා ය. ඔහු බලාපොරොත්තුවන්නට ඇත්තේ කී පමණින් පැනගෙන එන ස්නේහා කෙනකු වන්නට ඇත. තමා ඒ තරම් ලාබ නැතිවීම ගැන එක අතකින් ඈ ආඩම්බර විය.

"එහෙම වැඩ නං හොඳයි තමයි.. ඒත් ස්නේහා තමන්ගෙ දියුණුවට ඒවායින් වැඩක් වෙන්නෙ නැහැ නේද? ගමට වෙලා සමාජ සේවය කර කර ඉන්න නං නර්සිං ඉගෙන ගත්තෙ මොකටද?"

"නොකීවට මහත්තයා මාත් ඕකම තමා හිතුවෙ" තාත්තා කියන්නේ ඉවතට යන අතරය. තාත්තා මේ යන්නේ මේනකට ගෙන යන්නට තැඹිලි වල්ලක් බා ගන්නට කොල්ලකු සොයා ගන්නටය.

"ඔයා කියන්නෙ මොනාද කියලා මං දන්නෙ නෑ ස්නේහා.. ඔයා මොකක් හරි මිස්අන්ඩර්ස්ටෑන්ඩින් එකක ඉන්නෙ" ඔහු කීවේ ය.